කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

නිවේදන අංකය : **06** WW/TC/22/03/05/06

වර්ණය : රතු

# නිරිත දිග බෙංගාල බොක්ක **මුහුදු ප්‍රදේශයේ පවතින** ගැඹුරු පීඩන අවපාතය **පිළිබඳ අනතුරු ඇඟවීම**

**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වාභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින්**
2022 මාර්තු මස 05 වන දින පෙ.ව. 10.30 ට නිකුත් කරන ලදි.

ශ්‍රී ලංකාවේ උතුරු සහ නැගෙනහිර වෙරළට ඔබ්බෙන් වන නොගැඹුරු සහ ගැඹුරු මුහුදු ප්‍රදේශ සඳහා

**සැලකිලිමත් වන්න!**

**නිරිත දිග බෙංගාල බොක්ක ආශ්‍රිතව පවතින ගැඹුරු පීඩන අවපාතය මාර්තු මස 05 දින පෙ.ව. 05.30 වන විට, ශ්‍රී ලංකාවේ ත්‍රිකුණාමල වෙරළට කි.මී. 330 ක් ඊසාන දෙසින් (11.0N, 82.6E) ස්ථානගතව පැවතුනි. මෙම පද්ධතිය මාර්තු 05 දින සවස් කාලය වනතෙක් වයඹ දෙසට ගමන් කර, ඉන් අනතුරුව පැය 36 ක කාලය තුල බස්නාහිරට බරව නිරිත දෙසට ගමන් කරමින් උතුරු තමිල්නාඩු වෙරළ වෙත ළඟා වනු ඇතැයි අපේක්ෂා කෙරේ.**




**Source: RSMC India**

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

| පුරෝකථන සුළි කේන්ද්‍රය සහ මධ්‍ය ලක්ෂයේ සිට | | | |
|---|---|---|---|
| දිනය/ වේලාව (ලං. ස. වේ.)(පැය) | ස්ථානය (උතුරු අක්ෂාංශ/නැගෙනහිර දේශාංශ) | පද්ධති වර්ගීකරණය | ත්‍රිකුණාමලයට දුර (කි.මී) |
| 05.03.2022/1730 | 11.5N/82.4E | ගැඹුරු පීඩන අවපාතය | 292 |
| 06.03.2022/0530 | 11.4N/81.9E | ගැඹුරු පීඩන අවපාතය | 272 |
| 06.03.2022/1730 | 11.0 N/81.3E | පීඩන අවපාතය | 268 |

## අනතුරු ඇඟවීම්:

**මුහුදු ප්‍රදේශය සදහා:**

**ඉහත පද්ධතියේ බලපෑම හේතුවෙන්, ඉදිරි පැය 48 තුල දී දිවයිනේ උතුරු සහ ඊසාන දෙසින් වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශ වල නිරන්තර වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවිය හැක. සුළං වේගය ක්ෂණිකව පැ.කි.මී. (60-70) පමණ ඉහළ යාමට ඉඩ ඇති හෙයින් එම මුහුදු ප්‍රදේශය විටින් විට ඉතා රළු විය හැක.**

**ත්‍රිකුණාමලය** සිට මඩකලපුව හරහා පොතුවිල් දක්වා සහ මන්නාරම සිට පුත්තලම හරහා කොළඹ දක්වා වන මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට **පැ.කි.මී. (45-55)** දක්වා ඉහළ යාමට හැකියාවක් පවතී.

## අනුගමනය කල යුතු ක්‍රියාමාර්ග:

- නැවත දැනුම් දෙන තුරු, මන්නාරම සිට කන්කසන්තුරය හරහා ත්‍රිකුණාමලය දක්වා වෙරළට ඔබ්බෙන් වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශවල ධීවර සහ නාවික කටයුතුවල නො යෙදෙන ලෙස අවවාද කරනු ලැබේ.
- **දැනට මෙම මුහුදු ප්‍රදේශ වල ධීවර කටයුතුවල යෙදී සිටින පිරිස වහාම ගොඩ බිමට හෝ ආරක්ෂිත ස්ථානයක් වෙත පැමිණෙන ලෙසට දන්වා සිටිනු ලැබේ.**
- **ත්‍රිකුණාමලය සිට මඩකලපුව හරහා පොතුවිල් දක්වා සහ මන්නාරම සිට පුත්තලම හරහා කොළඹ දක්වා වන මුහුදු ප්‍රදේශවල ධීවර සහ නාවික කටයුතුවල යෙදීමේ දී වඩාත් අවධානයෙන් පසු වන ලෙස ඉල්ලා සිටින අතර කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් මේ සම්බන්ධව නිකුත් කරන ඉදිරි නිවේදන පිළිබඳ සිය අවධානය යොමු කරන ලෙස තවදුරටත් ඉල්ලා සිටිනු ලැබේ.**

මීළඟ නිවේදනය **2022.03.06** දින පෙ.ව. 10.30ට නිකුත් කෙරේ.